# සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
# சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
# Department of Samurdhi Development

මුදල් අමාත්‍යාංශය
සමෘද්ධි , ගෘහ ආර්ථික , ක්ෂුද්‍ර මූල්‍ය , ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය
நிதி அமைச்சு
சமுர்த்தி, வதிவிடப் பொருளாதார,நுண்நிதிய, சுயதொழில்,மற்றும் வியாபார அபிவிருத்தி இராஜாங்க அமைச்சு
Ministry of Finance
State Ministry of Samurdhi, Household Economy, Micro Finance, Self Employment and Business Development


| මගේ අංකය<br>எனது இல<br>My No | DSD/HO/04/ER/Circular/2021 | ඔබේ අංකය<br>உமது இல<br>Your No | ............................................ | දිනය<br>திகதி<br>Date | 2021.05.28 |
|---|---|---|---|---|---|

සමෘද්ධි චක්‍රලේඛ අංක 2021 / 05 /1

සියළුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂවරුන්,
සියළුම ප්‍රාදේශිය ලේකම්වරුන්,
සියළුම දිස්ත්‍රික් සමෘද්ධී නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂවරුන්,
සියළුම සමෘද්ධි කළමණාකරුවන් හා සමෘද්ධි සංවර්ධන නිලධාරින් වෙත,

## සමෘද්ධී පවුල් ලක්ෂ දෙකක් ( 200,000 ක්) කේන්ද්‍ර කර ගත් අංග සම්පූර්ණ ගෘහ නේවාසික ආර්ථිකයක් සංවර්ධනය කිරිමේ වැඩසටහන -2021

සමෘද්ධි වැඩසටහන් ක්‍රියාත්මක වීමේදි රජය විසින් නිකුත් කර ඇති Covid මාර්ගෝපදේශයන්ට අනුගත වෙමින් කටයුතු කළ යුතු බව පළමුව ඔබ වෙත කාරුණිකව පෙන්වා දෙමි.

මා විසින් නිකුත් කරන ලද 2021 / 05 උක්ත වැඩසටහන සම්බන්ධයෙන් වු චක්‍රලේඛයට අමතර වශයෙන් මෙම උපදෙස් නිකුත් කරමි.

සමෘද්ධිලාභි පවුල් 200,000 ක් ඉලක්ක කර ගනිමින් ක්‍රියාත්මක උක්ත වැඩසටහන යටතේ සමෘද්ධිලාභීන්ට අමතරව ශක්‍යතාවය හා සුදුසුකම් ඇති අඩුආදායම්ලාභි පවුල් ද මෙම වැඩසටහනට ඇතුලත් කර ගන්නා ලෙස තාක්ෂණික සහයෝගය ලබා දෙන ආයතන විසින් ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරිම සඳහා වන කාර්යය සාධන බලකාය වෙත නිර්දේශ කර ඇත.

ඊට අදාල එකඟතාවය ලබා ගන්නා ලෙස මුදල් අමාත්‍යාංශ ලේකම් වෙත 2021.05.04 දින අරලිය ගහ මන්දිරයේ පැවැති ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරිම සඳහා වන කාර්යය සාධන බලකා රැස්වීමේදි දන්වා ඇති අතර ඒ අනුව මුදල් අමාත්‍යාංශ ලේකම් විසින් 2021.05.05 දින වාචිකව ඊට උපදෙස් ලබා දුන් බව 2021.05.06 වන දින අප අමාත්‍යාංශ ලේකම් විසින් මා වෙත දන්වා ඇත. (අදාල ලිපි මේ සමඟ අමුණා ඇත.)

ඒ අනුව පහත සඳහන් නිර්ණායකයන්ට අනුව අඩු ආදායම්ලාභි පවුල්ද මෙම වැඩසටහන යටතේ සවිබලගැන්විමේ කාර්යය සඳහා ඇතුලත් කර ගැනිමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වමි.

1. සමෘද්ධී බැංකු ගිණුමක් හිමි හා ප්‍රජා මූල සංවිධානවල සාමාජිකත්වය ලබා ගෙන ඇති අඩු ආදායම්ලාභී පවුල් මෙම වැඩසටහනට ඇතුලත් කර ගත හැකිය.

2. යම් අඩු ආදායම්ලාභියෙකුට සමෘද්ධී බැංකු ගිණුමක් හෝ ප්‍රජා මූල සාමාජිකත්වය ලබා නොමැත්තේ නම් ගිණුම් හිමිකාරිත්වය හා ප්‍රජා මූල සාමාජිකත්වය ලබා දීම තුළින් මෙම වැඩසටහනට ඇතුලත් කර ගත හැකි වනු ඇත.


1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල්<br>பணிப்பாளர் தலைமையதிபதி<br>Director General | අතිරේක අධ්‍යක්ෂ ජනරාල් (පාලන හා ආයතන)<br>மேலதிக பணிப்பாளர் தலைமையதிபதி ( நிர்வாகம்/தாபனம்)<br>Additional Director General (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී<br>பிரதான கணக்காளர்<br>Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය)<br>பணிப்பாளர் (குறு நிதி )<br>Director ( Micro Finance) | කාර්යාලය<br>அலுவலகம்<br>Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dg@samurdhi.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | **Hot Line :0112-889007** | | **Hot Line:0112-885582** | **Hot Line: 011- 2887722** |

3. ඒ අනුව තෝරා ගනු ලබන අඩු ආදායම්ලාභීන් සවිබල ගැන්වීම කෙරෙහි දැඩි උනන්දුවක් දක්වන , දැනට ජීවන මාර්ගයක නිරත හෝ නිරතවීමට අපේක්ෂා කරන්නෙකු විය යුතුය. එමෙන්ම ඔහුට හෝ පවුලේ සමාජිකයකුට යෝජිත ජීවන මාර්ගය පිළිබඳව දැනුමක් (පුහුණුවක්, පළපුරුද්දක්) හෝ අත්දැකීමක් සහිත, ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ඉඩ කඩ ප්‍රමාණවත්ව ඇති අයෙකු වීමත් ග්‍රාමීය කමිටුවේ නිර්දේශිත අයකු වීමත් අවශ්‍ය වනු ඇත.

4. කෙසේ වුවත් අඩු ආදායම්ලාභීන් තෝරා ගත යුත්තේ 2021 / 05 සමෘද්ධි චක්‍රලේඛය පරිදි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකට වෙන් වන ප්‍රතිපාදන සීමාවට යටත්ව වනු ඇත.

5. එමෙන්ම දැනටමත් මෙම වැඩසටහන යටතේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ප්‍රතිලාභීන් හඳුනා ගනිමින් සිටින බැවින් යම් ග්‍රාම නිලධාරී වසමක සවිබලගැන්විය හැකි සමෘද්ධි ව්‍යාපෘතිලාභීන් ප්‍රමාණවත්ව නොමැත්තේ නම් එම වසම් සඳහා අඩු ආදායම්ලාභීන් ව්‍යාපෘතිලාභීන් ලෙස හඳුනා ගැනීමේ හැකියාව ඇත.

6. මෙම තෝරාගනු ලබන අඩු ආදායම්ලාභී පවුල් තොරතුරු CRM මොඩියුලයේ Project Applicant 2021 යටතේ ඇති තොරතුරු ඇතුලත් කිරීමේ පෝරමයේ Is Beneficiary යටතේ ඇති No (Low Income Family) යන්න තෝරා ඒ යටතේ තොරතුරු ඇතුලත් කළ යුතුය.

7. 2021 / 05 සමෘද්ධි චක්‍රලේඛයේ අනෙකුත් සියළු උපදෙස් ඒ අකාරයෙන් වලංගු වනු ඇත.

ආර්.පී.බී. තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් -

1. සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍ය ගරු ෂෙහාන් සේමසිංහ මැතිතුමා - කා.දැ.ගැ.පි.
2. ලේකම්, සමෘද්ධි, ගෘහ ආර්ථික, ක්ෂුද්‍ර මූල්‍ය, ස්වයං රැකියා හා ව්‍යාපාර සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය - කා.දැ.ගැ.පි.
3. ලේකම්, ආර්ථික පුනර්ජීවනය හා දරිද්‍රතාවය තුරන් කිරීම සඳහා වන කාර්යය සාධන බලකාය - කා.දැ.ගැ.පි.
4. ලේකම්, ජාතික ජීවනෝපාය සම්බන්ධීකරණ අනු කමිටුව - කා.දැ.ගැ.පි.
5. විගණකාධිපති, විගණකාධිපති දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
6. ප්‍රධාන ගණකාධිකාරි සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
7. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.
8. සියළුම අංශ ප්‍රධානීන් ,සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කා.දැ.ගැ.පි.